# සඤ්ඥාපනය

විද්‍යාලඞ්කාර විශ්ව විද්‍යාලයයේ ශාස්ත්‍රපති උපාධිය අපේක්ෂාවෙන් සැපයූ නිබන්ධයයැ මේ. නාමරූපසමාසය නම් පැරණි කුඩා අභිධර්මග්‍රන්ථය. හා එහි පැරණිසන්නය වූ සිලිපිටපත සංශෝධනය කොට එයට ප්‍රස්තාවනාවක් ලියා ඉදිරිපත් කිරීමට අපට නියම කරන ලදි. සැතපුම්සියගණන් ඈත පෙදෙස්වලින් පුස්කොලපිටපත් සපයා ගෙන නාමරූපසමාස ටීකාව ද ඇසුරුකොට නාමරූපසමාසය හා සිලිපිටපත ශුද්ධකෙළෙමු.

නාමරූපසමාසය හා සිලිපිටපත මෙයට පෙර මුද්‍රණය කරන ලද්දේ එක් වරකි.⊗ ඒ ක්‍රි:ව:1908 දිය.එය ශෝධනය කළේ බටපල ධම්මපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්.උන්වහන්සේට සපයා ගත හැකිවූයේ නාමරූපසමාසයේ එක ම පුස්කොල පිටපතක් බව උන්වහන්සේ ම එහි සඤ්ඥාපනයෙහි කීහ.

අපි නාමරූපසමාසයෙහි හා සිලිපිටපතෙහි පුස්කොල පිටපත් 5 ක් සපයාගෙන මෙහි ශෝධනය ඇරඹීමු. ඒ අතර ලංකාවේ අතිශය දුර්ලභ නාමරූපසමාසටීකාවේ පිටපතක් අම්බලන්ගොඩ පොල්වත්තේ අශෝකාරාමයේ ඇති බව අසා එය ද ලබාගෙන මූලිකග්‍රන්ථයේ අශුද්ධ බොහෝ තැන් ශුද්ධියට පැමිණවීමු. ඒ නාමරූපසමාසටීකාව පොල්වත්තේ බුද්ධදත්ත නාහිමිපාණන් විසින් බුරුමයේදී පිටපත් කරගන්නා ලද්දකි. ශෝධනයෙහි දී අපට මැනමයි වැටහුන පාඨය පොතට ගෙන එයට විශද්ධපාඨ අධෝලිපිගත කෙළෙමු.

මෙයට ප්‍රස්තාවනාව සැපයීමේදී විශ්ව විද්‍යාලයයෙන් අපට ලැබුන උවදෙස් මැනවින් අනුගමනය කෙළෙමු. අභිධර්මය පිළිබඳ ව හෝ තදීය මතභෙද පිළිබඳ ඛුව විමසීමකට නො ගොස් අභිධර්මසාහිත්‍යය ඉතිහාසය හා ගැටපද ඉතිහාසය පිළිබඳ කරුණු සැකෙවින් නියමිතග්‍රන්ථකාලය තෙක් දක්වමින් නියමිතග්‍රන්ථයෙහි ඇතුළත් කරුණු හැකිතාක් විමසීමට භාජන කරන්න යනු අපට ලැබුන උපදෙශයයි.මේ අනුව යමින් මෙහි ප්‍රස්තාවනාව සැපයීමු. යතුරුලියනයෙන් මුද්‍රිත පිටපත් තුනක් ඉදිරිපත් කිරීමට අපට නියම කරන ලදි.එහෙත් පාළි – සංස්කෘතවචන නො වරදවා ටයිප්ගැසියහැකි අය සොයාගැනීම පුස්කොළ පිටපත් සොයා ගැනීමටත් වඩා අපහසු කාර්‍යයක් විය. කඩදාසිපිටපත කොතරම් හොඳින් පැහැදිළි ව ලියා

⊗ බෙරණ්ඩේ ධම්මාරාම හිමි JPTS 1915-16 සිංහල අකුරෙන් මුද්‍රිත පොත් හා ටීකාව ...

දුන්නත් එකපදය කඩා ඇත් කොට ලිවීම ද වෙන් වෙන් පද ලංකොට ලිවීමද  වැළැක්වීමට අපි අපොහොසත් වීමු. ටයිප්ගැසීමේදී පළමුවන පිටපතේ අකුරුවලට වඩා කාබන්කොල තබා ගසනුලබන දෙවන තෙවන පිටපත්වල අකුරු පැහැදිළිකමින් ඌනත්වයක් ගැනීම ද නොවැලැක්විය හැක්කකි.

---

හඟුරන්කෙත විමල සථවිර.